# මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවෙහි කළමණාකරණ සහකාර අධි පන්තිය සේවා ගණයේ සහකාර මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධිකාරි තනතුර සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය

## 01. සම්බන්ධවන ආයතන

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව: | මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | යොමු අංකය: | මිප්‍ර /බඳ /පරි-MN-07 | දිනය: | 2014.04.11 |
| 1.2 | අමාත්‍යාංශය : | කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශය | යොමු අංකය: | සීඅයිටී/ 2/9/3/6-1 | දිනය: | 2014.04.27 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | | යොමු අංකය: | DMS/1225 | දිනය: | 2014.09.15 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | | යොමු අංකය: | EST-3/RECRU/03/4615 | දිනය: | 2014.02.26 |
| 1.5 | ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය | | යොමු අංකය: | NPC/1/45/006/SR | දිනය: | 2014.08.08 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | | යොමු අංකය: | PSC/EST/05-01-45/02/2014 | දිනය: | 2015.08.13 |

## 02. පත්කිරීම් බලධරයා : - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## 03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : කළමණාකරණ සහකාර- අධි පන්තිය

3.2 ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචන :

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවෙහි නෛතික මිනුම් විද්‍යා කාර්යයන්ට උපස්ථම්භක වනසේ විධායකය විසින් නිශ්චිත කොට පවරා දෙනු ලබන අධීක්ෂණය , හැසිරීම , ව්‍යාපෘති සංවිධානය , පිරිස් පාලනය , ගාස්තු එකතු කිරීම හා ගෙවීම , පාරිභෝගික දැනුවත් කිරීම ආදී කාර්යයන් ඇතුලත් බහුකාර්යයන් ඉටු කරන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෝෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන මෙම ශ්‍රේණියේ නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප් :

5.1 වැටුප් කේත අංකය: MN-07- 2006 A

5.2 වැටුප් පරිමාණය : රු 20,030-11 X 365 -18 X 500 - 33,045/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය රු : |
|---|---|---|
| විශේෂ ශ්‍රේණිය | පියවර 04 | 21,125 |

06. සේවා ගණයට අයත් තනතුර

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| සහකාර මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධිකාරී | 04 | 1. මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනතින් හෝ පනත යටතේ මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධිකාරීවරුන්ට පවරා ඇති බලතල හා කාර්යයන් මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධිකාරීවරුන්ගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව ක්‍රියාත්මක කිරීම.<br>2. මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂකවරුන්ගේ වැඩ අධීක්ෂණය කිරීම හැසිරවීම හා ඇගයීම.<br>3. නව නෛතික මිනුම් විද්‍යා ව්‍යාපෘති සංවිධානය කිරීම.<br>4. නෛතික මිනුම් විද්‍යා පරිපාලනය සඳහා භෞතික සම්පත් පවත්වා ගැනීම හා සැපයීම.<br>5. ගාස්තු එකතු කිරීම , බැංකු ගත කිරීම හා ගෙවීම පිළිබඳ පරීක්ෂා කිරීම හා මෙහෙයවීම.<br>6. පාරිභෝගිකයා දැනුවත් කිරීමේ වැඩ සටහන් යෝජනා කිරීම සංවිධානය කිරීම හා මෙහෙයවීම.<br>7. මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂකවරුන්ගේ වැඩ හා පාලන කටයුතු සංවිධානය කිරීම.<br>8. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව: 04

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100 % |
| කුසලතා | අදාළ නොවේ |

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ

7.3 සීමිත බඳවා ගැනීම :

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7.3.2 **සුදුසුකම්**

7.3.2.1 : අධ්‍යාපන සුදුසුකම් : බඳවා ගනු ලබන්නේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂකවරුන් අතුරින් වන බැවින් අදාළ නොවේ.

7.3.2.2 : වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ.

7.3.2.3 : පළපුරුද්ද : අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික අධි පන්තිය සේවා ගණයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක වරයෙකු හෝ අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හයක (06) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හයම (06) ම උපයාගෙන තිබීම.

7.3.2.4 : කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5: වෙනත්:

I. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නම වසර පහ (05)තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. I වන ශ්‍රේණියට නියමිත තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.3.2.හි සඳහන් සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3වයස - අදාළ නොවේ

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය : (ඇමුණුම 01)

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| නෛතික මිනුම් විද්‍යා පද්ධතිය | 100 | 40% |
| අභියෝග්‍යතාවය | 100 | 40% |

7.3.4.1.1 **විභාගය පවත්වන බලධරයා -**

**විභාග කොමසාරිස් ජනරාල්** විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු **ලබන** ආයතනයක් මගින්.

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4.4ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බල්නු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක සේවා පළපුරුද්ද | 50 | අදාළ නොවේ |
| වෙනත් සුදුසුකම් | 45 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

සටහන :

1.බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී ඉහත වගුවේ දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමත කරවා ගැනීමට කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කළ යුතුය.

2.පළමුව ලිඛිත විභාගය පවත්වනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් අතුරින් කුසලතා අනුපිළිවෙලට බඳවා ගැනිමට නියමිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය හා ලිඛිත පරීක්ෂණයේ ලකුණු වල එකතුවේ කුසලතාවයේ අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවාගනු ලැබේ.

7.3.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තර නිවේදනයක් සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4. කුසලතා මත බඳවා ගැනීම - අදාල නොවේ.

**08. කාර්යක්ෂමතා කඩඉම්** - අදාළ නොවේ

**09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය** - අදාල නොවේ

**10.“ශ්‍රේණි උසස් කිරීම ”** - අදාළ නොවේ.

**11. තනතුරුවලට පත්කිරීම** - අදාළ නොවේ.

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ**

“සක්‍රිය සේවා කාලය” යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රිය සේවාකාලය සඳහා ගණනය කරනු නොලබන්නේය .

**13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :** අදාළ නොවේ.

**14. අන්තර්ග්‍රහණ විධිවිධාන:** අදාළ නොවේ.

**15.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

**16.** මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

| සකස් කළේ | | පරීක්ෂා කළේ | |
|---|---|---|---|
| අත්සන : | (signature) | අත්සන : | (signature) |
| නම : | ජේ. ඩබ්. පී. පී. එම්. ජයවර්ධන | නම : | එම්. ඒ. අයි. එච්. පෙරේරා |
| තනතුර : | පරිපාලන නිලධාරි (වැ.බ) මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | තනතුර : | සහකාර අධ්‍යක්ෂ (පාලන) මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මාහේනවත්ත, පිටිපන, හෝමාගම. |
| දිනය : | 2016.04.27 | දිනය : | 2016/04/27 |

අත්සන :............................................ (signature)

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : කේ. ප්‍රේමසිරි කුමාර

තනතුර : අධ්‍යක්ෂ (වැ:බ) මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

දිනය: 2016-04-28

නිල මුද්‍රාව : මාහේනවත්ත, පිටිපන, හෝමාගම.

යොමු අංකය :

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර අධිපන්තිය සේවා ගණයේ සහකාර මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධිකාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................

නම :

ලේකම් :

කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශය

ටී. එම්. කේ. බී. තෙන්නකෝන්
ලේකම්
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
73/1, ගාලු පාර,
කොළඹ 03.

දිනය: ..............................

නිලමුද්‍රාව: ..............................

---

යොමු අංකය : PSC/EST/05-01-45/02/2014

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවෙ හි ~~අධීක්ෂණ~~ කළමනාකරණ සහකාර අධිපන්තිය සේවා ගණයේ සහකාර මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධිකාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය

.........2015-08-13.......... දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමතකරන ලදී.

අත්සන : ..............................

නම : ..............................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය: ...2016-08-11.......

නිලමුද්‍රාව: ..............................

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

ඇමුණුම 01

1.විභාගයේ නම : මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවෙහි කළමණාකරණ සහකාර අධිපන්තිය සේවා ගණයේ සහකාර මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධිකාරී තනතුරට බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය.

2.විභාගය පිළිබඳ විස්තර : ලිඛිත පරීක්ෂණයකි .

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතාවය | පැය 01 | 100 | 40 % |
| නෛතික මිනුම් විද්‍යා පද්ධතිය | පැය 02 | 100 | 40 % |

3.විභාගය පවත්වනු ලබන බලධරයා :

විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්.

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝග්‍යතාවය | අපේක්ෂකයාගේ තර්කානුකූලව සිතීමේ හැකියාව , විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. |
| නෛතික මිනුම් විද්‍යා පද්ධතිය | 1.නෛතික මිනුම් විද්‍යාව<br>2.මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනත<br>3.දෙපාර්තමේන්තු රෙගුලාසි<br>4. නව නීති වාර්ථා |

සකස් කළේ

අත්සන :------------------------------

නම :------------------------------

තනතුර :------------------------------

දිනය :------------------------------

ඩී.පී.ආර්. සඳමාලි
සංවර්ධන නිලධාරි
මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
මාහේනවත්ත, පිටිපන, හෝමාගම.

පරීක්ෂා කලේ

අත්සන :------------------------------

නම :------------------------------

තනතුර :------------------------------

දිනය : 2016/07/04

M. A. I. H. Perera
Assistant Director (Admin)
Measurement units Standards and Services Department
Mahenawatta, Pitipana, Homagama.

අත්සන :------------------------------

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :------------------------------

තනතුර :------------------------------

දිනය : 2016/07/04

නිල මුද්‍රාව :------------------------------

කේ. ප්‍රේමසිරි කුමාර
අධ්‍යක්ෂ (වැ.බ)
මිනුම් ඒකක ප්‍රමිති හා
සේවා දෙපාර්තමේන්තුව
මාහේනවත්ත, පිටිපන, හෝමාගම.